දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපැල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி)
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல ) EPID/508/2026
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය )
திகதி ) 22/04/2026
Date )

# සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
## சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு
## Ministry of Health & Mass Media

සියලුම පළාත්/ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
අධ්‍යක්ෂ - ජාතික සෞඛ්‍ය විද්‍යායතනය
ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් - කොළඹ/මහනුවර
සියලුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්

**2026 වෙසක් සහ පොසොන් පොහොය වෙනුවෙන් දිවයින පුරා පවත්වනු ලබන දන්සැල් වල ආහාර සුරක්ෂිතතාව සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ මාලාව**

ඉහත සඳහන් කාලවල දිවයින පුරා පවත්වනු ලබන දන්සැල් වල ආහාර සුරක්ෂිතතාව සම්බන්ධයෙන් සහතික වීම ප්‍රදේශයේ ආහාර බලධාරීන්ගේ සහ බලයලත් නිලධාරීන්ගේ වගකීම වේ. එබැවින් දන්සැල් සම්බන්ධයෙන් පහත මාර්ගෝපදේශ අනුගමනය කරන ලෙස ඔබ කොට්ඨාසයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් ඇතුලු ආහාර පනතේ සියලුම බලධාරීන් සහ බලයලත් නිලධාරීන්ට උපදෙස් ලබා දෙන මෙන් මෙයින් දන්වා සිටිමි.

1. සියලුම දන්සැල් මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාස මට්ටමින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ ලියාපදිංචි කළ යුතුය.
2. දන්සැල් පවත්වන ස්ථානය, පවත්වන අයගේ නම, ලිපිනය, දුරකතන අංකය වැනි මූලික තොරතුරු ලියාපදිංචියට ඇතුළත් කරගත යුතුය.
3. සෞඛ්‍යාරක්ෂිතව දන්සැල් පවත්වාගෙන යාම පිළිබඳව දන්සැල් සංවිධායකයින්ව මනාව දැනුවත් කළ යුතුය.
4. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් හා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසින් දන්සැල් පරීක්ෂා කිරීමේදී, 2011 ආහාර ස්වස්ථතා රෙගුලාසි වලට අනුකූලව කටයුතු කරන බවට වග බලා ගත යුතුය.
5. දන්සැල් ආරම්භ කිරීමට පෙර සහ දන්සැල් අවසන් කිරීමෙන් පසු මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් ස්ථානය පරීක්ෂා කර සෞඛ්‍යාරක්ෂිතබව සහ පරිසර සෞඛ්‍යයට හානි නොවන බවට වග බලා ගත යුතුය.
6. ආරම්භයේ සිට අවසානය දක්වා නිසි කසළ කලමනාකරණ වැඩපිළිවෙලක් යොදා ගත යුතුය.
7. හැකි සෑම විටම ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ ජලය දන්සැලේ ආහාර සකස් කිරීමට සහ පරිභෝජනයට යොදාගැනීමට වග බලා ගන්නා ලෙසත්, එසේ කළ නොහැකි අවස්ථා වලදී ආරක්ෂිත ජල මූලාශ්‍රවලින් ජලය ලබාගැනීමට කටයුතු කළ යුතුය.
8. දන්සැල ආශ්‍රිතව ආහාර අනුභවය සිදු කරන අවස්ථාවලදී අත් සේදීම සඳහා ජල පහසුකම් සහ අත් පිරිසිදුකාරක සපයා ඇති බවට සහතික කළ යුතුය.
9. දන්සැලේ ආහාර පිළියෙල කිරීම සහ පරිභෝජනය අතර කාලය පැය 04 කට නොවැඩි විය යුතුය.

ඉහත කරුණු අනුගමනය කරමින් පොහොය සමයේ ඔබ ප්‍රදේශයේ ආහාර සෞඛ්‍යය පවත්වා ගැනීමට දක්වන සහයෝගය අගය කරමි.

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.